කවරෙකුට දැඩි අවශ්යතාවක් ඇති වී, ඔහු මිනිසුන්ගෙන් එය ඉල්ලා සිටින්නේ නම් ඔහුගේ අවශ්යතාව පිරිමැසෙන්නේ නැත. කවරෙකු එය අල්ලාහ් වෙතින් ඉල්ලා සිටින්නේ ද මතුලොවෙහි හෝ මෙලොවෙහි හෝ පෝෂණය අල්ලාහ් ඔහුට ළඟා කර දෙයි.

ඉබ්නු මස්ඌද් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී.“කවරෙකුට දැඩි
අවශ්යතාවක් ඇති වී, ඔහු මිනිසුන්ගෙන් එය ඉල්ලා සිටින්නේ නම් ඔහුගේ අවශ්යතාව
සපුරනු ලබන්නේ නැත. කවරෙකු එය අල්ලාහ් වෙතින් ඉල්ලා සිටින්නේ ද මතුලොවෙහි හෝ මෙලොවෙහි හෝ පෝෂණය අල්ලාහ් ඔහුට ළඟා කර දෙයි.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත -
අහ්මද් එය වාර්තා කර ඇත]

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කරයි. “කවරෙකුට දුෂ්කරතාවයක් ඇති වී, එනම් දැඩි අවශ්යතාවය, දුෂ්කරත්වයේ දැඩි දරිද්රතාවයේ දැඩි ලෙස කටයුතු කිරීමය. “ඔහු මිනිසුන්ගෙන් එය ඉල්ලා සිටින්නේ නම්” එනම්: එය ඔවුනට ඉදිරිපත් කොට ඔවුන්ගේ ආයාචනා කරමින් එය හෙළි කොට එම දුෂ්කරතාවෙන් ඔහුව ඉවත් කරන මෙන් ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නේ නම් යන්නයි. එහි ප්රතිඵලය “ඔහුගේ අවශ්යතාව සපුරනු ලබන්නේ නැත.” යන්නයි. එනම් ඔහුගේ අවශ්යතාව ඉටු වන්නේ නැත. ඔහුගේ දුෂ්කරතාව ඉවත් වන්නේ නැත. අවශ්යතාව සපුරා ගන්නට බලන සෑම අවස්ථාවකම ඊට වඩා දරුණු තවත් කරුණක් ඔහුට ඇති වනු ඇත. තම භාරකරු වන අල්ලාහ් මත ස්ථාවරව හිදිමින් “කවරෙකු එය අල්ලාහ් වෙතින් ඉල්ලා සිටින්නේ ද කල් ඇතිවම මෙලොවෙහි ඉක්මන් කර දෙනු ඇත. ඉතා සමීපයෙන් ඔහුට ධනය පිරිනමා ඔහුව පොහොසතකු බවට පත් කරනු ඇත. එසේ නැතහොත් මතුලොවෙහි එය ප්රමාද කර දෙනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/4183